# හොඳ සිංහල



වි ක ධර්මබන්ධු

නිල් මැස්සා ම නිලමැස්සා වන සැටි බලා හෝ එලිවැට රැකීම සඳහා හෝ ''සෝබනය'' සඳහා හෝ තොටගමුවේ යතිවරයා මැවූ නිල් තුරඟා ම ''නිල තුරඟුට නැඟෙමින් රිවි දෙව් සිරිත'' යන තැන ''නිල'' වූ සැටි ඔබ දනිති. එහෙත් අපි ඒ අනුයමින් නිල මානෙල් නිල් මැනික් ගැන නොක-යමු.

රැන ගිරව් යන්නේ රැන යනු ''රන්'' යන්න සඳහා ද රංචුව සඳහා ද යන්න හරියට කීමට මම නොදනිමි. එහෙත් බොහෝ පත් පොත්වල සඳහන් වන ''රන ගිරව්'' - ''රන මොනරු'' ''රන් ගිරව් - රන් මොනරු'' යන අරුතෙහි යෙදී ඇති බව දනිමි.

එය පසුගිය ලිපියෙහි ද දක්විනි. වලි කුකුලන් සඳහා වලිකුකුලන් යන්න බාවිතා වන බව ඔබ අසා ඇත. කුකුලන් සඳහා ''වල් (වලි)'' යෙදෙතත් සැව්ලන් සඳහා යෙදෙන්නේ ''වන'' යන්නය්. වල් (වලි කුකුලා - වන සැව්ලා වෙතත් වන කුකුලා - වල් සැව්ලා අපේ කටටත් කනටත් නුහුරුය. වලිකුකුලා දෙස බලා කිසිවෙක් වලි ඌරකු ගැන හෝ වලි හරකකු ගැන නොකියති. කලු මීමා කුලු හරකා යන යන දෙතැන ඇති ''කුලු'' යන පදය ගැන ද සිතා බැලිය යුතුය. දැන් අපි අපේ රූඩි පහට සිත දෙමු.

1. ගහ දන්නා අයට කොල කඩා පාන්න ඕනයැ? (නෑනේ) මෙය්න් දෙන අදහසට ගසක් හෝ කොල සම්බන්ද නැත. ඔබ යමකු ගැන මට කියති. ඇතැම් විට එය ඔහුගේ ගුන පැත්ත විය හැකිය. ඔබටත් වඩා හොඳින් මම ඔහු ගැන දනිමි. ඔබ ඔහුගේ අගුන පැත්ත කියන්නටද බැරි නැත. ඔබ ඔහුගේ හොඳ කීවත් නරක කීවත් මට එහි වැදගත් කමක් නැත. ඔහු ගැන ඔබ නොදන්නා දේ පවා මම දනිමි. ඔහුගේ යහපත සඳහා හෝ අයහපත සඳහා ඔබට කෙන්ද කන්ද කොට කිව හැකිය.

2. පරන පිනක් මගේ ඉහේ කඩා ගෙන වැටුනා. පිනක හොඳ විපාකත් පවක නරක විපාකත් ඉක්මනින් දැක ගන්නට අප කැමති නොවැ. බොහෝ පින් රැස් කල බොහෝ පිරිත් සහ බන ඇසූ අපේ නැන්දා කෙනකු ගේ ඇස් අඳ විය. අනෙ අම්මේ මොකද මට මේ උනේ. කොහොමට පිං කරපු කෙනෙක් ද මං'' මේ ඇය නැඟූ අවලාදයකි. පිනක් ඉහ මත කඩා වැටෙන්නේ බාග්‍යයකටය. අලුත් පිනක් ඉහ මත කඩා වැටෙන්නේ බාග්‍යයකටය. අලුත් පින අපට මතකය. ඒ අනුව අපට උදා වූ බාගයය.

අසවල් පින හෝ පින් නිසා බව අපිට හිතා ගත හැකිය. ඔබට ඩොලර් සිය දහසක (ලක්සයක) ලොටරියක් ඇදේ. පසුගිය මාසයේ ඔබ පන්සලට ඩොලරු දහසක් වටිනා ටෙලිවිස්නක් තෑගි කලහ. අලුත් පිනේ විපාක වසයෙන් ඔය එය සලකනු ඇත. පරන පින ඔබට හරියට නිච්චි නැත. එහෙය්න් මේ හදිසි සිදුවීමට බල පෑ පින ඔබට සිතාගත නොහැක. ඔබේ ඉහ මත කඩා ගෙන වැටී ඇත්තේ පරන පිනකි.

3. උගුරට හොරා බේත් කන්න බෑ (බං) මේ රූඩිය සිංහල බේත් පමණක් තිබුනු එදාට ගැලපෙතත් අදට මෙය නොගැලපෙන බවක් පෙනේ. උගුරට හොරා බේත් කෑම යනු උගුරට රස හෝ සැර නොදැනෙන්නට බේත් කෑමය. ගුලි, කල්ක කසාය අරිස්ට වලඳන විට උගුරට දැනේ. එහෙත් අද එය වෙනස් ය. බේත් එන්නත් කිරීමක් පැනි රස කල සිරප් (බේත් පැනි) සීනි දැවටු පෙති සහ කැප්සුලි නිසා බේතෙහි නියම රසය උගුරට නොදැනේ. මෙහි අදහසට ද බේත් හෝ උගුර සම්බන්ද නැත. සිතා මතා කල කී දේ තමාගෙ අනු දැනුමක් නැතිව හෝ තමා නොදැනුවත්ව සිදු වූ බව පෙන්වන්නට තතනන විට මේ කියමන ගැලපේ. මම මගේ පියා රවටා ගේ දොර මගේ නමට ලියවා ගතිමි. රහස එලිදරව් විය. ඒ පියා මිය ගිය පසුය. පියා තම කැමැත්තෙන් ගේ දොර මගේ නමට ලියා ඇති බව මම මල්ලිට කියමි. එවිට මල්ලි මේ රූඩියෙන් මට පිලිතුරු දෙනු ඇත.

4. පයේ බරවෙට පිටි කරේ බේත් බැදලා වැඩක් නෑ. ආයුර්වේදයට අනුව සියලුම රෝගවලට හේතුව හෙවත් නිදානය වා පිත් සෙම් යන තුනින් එකකට සම්බන්දය. සමහර විට තුන් දොස් ම කිපීමෙන් හැදෙන ලෙඩ ද ඇත. බරවාය වාත රෝගයකි. බරූවා යන දෙ පදය එක් වී ඒ නම සෑදි ඇතැය් සිතමි. බරවා වැඩි වසයෙන් දක්නට ලැබෙන්නේ පාදවලය්. එය මදුරුවකු නිසා ඇති වන ලෙඩක් බව දැන් අපි දනිමු. වනයක් හෝ තුවාලයක් ඇති වීම එතැනට බේත් කල යුතුය. බරවයටත් බේත් කල යුත්තේ එසේ යැය් පැරැන්නෝ සිතූහ. ඒ එදා විස්වාසයය්. පනු ගායෙන් පීඩා විඳි දරුවාට තොයිල් නටවා ඒ දරුවා මරා ගත් සිද්දියක් අසා ඇත්තෙමි. අපිරිසිදු කම නිසා ගෙදර හැම-දෙනා ම නිතර නිතර ලෙඩ වෙති. යකඳුරු මතය වන්නේ ගෙදරට කොඩි විනයක් කර ඇති බවය. ඔවින් හා අමනාපව සිටින අසල්වැසියාට ''වැහි නැති හෙන ගසා ඔවුන්ගේ මුලු පවුලම සූන්න'' විය යුතුය. ඒ නිවසේ කොඩි වින කැපීම් වස් කවි කීම් නිතර සිදු වේ. පයේ බරවයට ඔහු පිටි කරේ (කරේ පිටි පැත්තේ) බේත් බඳිති.

5. පනින රිලවින්ට ඉනිමං බඳින්න ඕනයෑ? (නෑනේ) රිලව් ඇත්තෙත් අත්තට පැන පැන යති. වැඩි වසයෙන් ඔහු ගස් මත සිටිති. නිඳා ගනිති. ගුහා පරුවත වල පවත්වන රිලව් ද සිටිති. සමහරු රංචු පිටින් බිම සැරිසරති. පැනිය නොහැකි රිලවින් නැති නිසා ''පනින' යන වචනය නැතිව ද එය ගත හැකිය. ඉනිමං බාවිතා කරන්නේ මිනිසුන්ය. රිලවින්ට ඉනිමං උවමනා නැත. ඔවින්ට ඉනිමං බැඳීම හොඳ සිහියෙන් කරන වැඩක් නොවේ.

සන්නසේ ඇතැම් ලිපිවල නොහොත් සහ එහෙත් පටලා ගෙන ලියා ඇති තැන් දක්නට ලැබේ. ඩබ්ලිව්. ඒ සිල්වාගේ නවකතාවක (නවලුවක) සිරසේ හෙවත් වෙනුවට 'නොහොත්'' යොදා තිබුනු බව මතකය. මගේ මතකය හරි නම් 'සුනේත්‍රා නොහොත් නොනැසෙන රැජින'' ඒ නම විය යුතුය. එය සදොස්ය. නොහොත් යනු නැතහොත් නොවේ නම් යන තේරුම දෙන පදයකි. මේ නිදසුන තේරුම් ගන්න.

* ගුහාව තුල කොටියකු නොහොත් වලසකු සිටිනු පෙනේ.
* ඔවින් දොඩන්නේ චීන නොහොත් කොරියානු බසිනි.

මෙහි 'නොහොත්'' වෙනුවට ''හෝ'' යොදා කොටියකු හෝ වලසකු - චීන හෝ කොරියානු යනුවෙන් ලිවිය හැකිය. දොඩන බසේ දී බාවිතා වන ''හරි'' යන්න දෙපලෙහි ම යෙදිය යුතුය. කොටියකු හරි වලසකු හරි - චීන හරි කොරියානු හරි යනුවෙනි. ඒ, එහි කියවෙන්නේ දෙදෙනෙකු හෝ දෙකක් ගැන ය.

''හෙවත්''යන්නේ ඇත්තේ වෙනස් තේරුමකි. එහි කියවෙන්නේ එකකු හෝ එකක් ගැනය.

* ගුහාව තුල නරියකු හෙවත් හිවලකු සිටිනු පෙනේ.
* බුදු දහම ලියවී ඇත්තේ පාලි හෙවත් මග ද බසිනි.

අද අප ඉගෙන ගන්නට යන්නේ

1. ගහේ කටු උල් කරන්නට ඕනෑ යැ (නෑ නේ)
2. උං ගඟෙං දිය බීලෝ මූදට ආ වඩනවෝ.
3. ඒකා දිව දෙකේ මිනිහා
4. නරකාදිය තියෙන්නෙ පොල්ලෙලි පුරවන්න නෙව්.

## දුප්පත් පෝසත් වෙනස

දුක් පත් යන්නේ තේරුම දුකට පැමිනි යනුය. මෙහි දුකට පත් වී ඇත්තේ අග හිඟකම් නිසාය. නැති බැරි කම තරම් දුකක් තවත් නැති තරම් ය. ලෙඩ දුක් ඇති වූ විට නැති බැරිකම නිසා එය්න් මිදීම අපහසු වේ. නැති බැරි කම නිසා ඇති වූ දුක මුල් කරගෙන දුක් පත් - දුප්පත් වී එහි තේරුම ද මඳක් වෙනස් වී ඇතැය් සිතමි. එහි දැන් ඇත්තේ 'දිලිඳු'' යන තේරුමය්.

දුක් පත් යන්න දුප්පත් වී ඇත් නම්, පොහොසත් යන්න හැදුනේ කෙසේද ? මෙය වසර දහසකටත් වඩා මගේ හිතට වද දුන් ගැටලුවකි. ආකිමිඩීස් මෙන් මම ජය ලත්මි.
''දුක්'' යන්නේ විරුදු පදය සැප හෝ සුව වේ දුක සැප / සුව දුක් යනුවෙන් එය වහරේ පවතී. ''දුක් පත්'' යන්නට විරුදු තේරුම දෙන්නේ ''සුව පත්'' යන්නය්. අත මිට සරුවීම, ඇති හැකි වීම සුව පත් වීමකි.
මව -මෝ, ගව - ගෝ වේ. මුව දොර - මෝදර, මුවර - මෝර දුවනි - දෝනි, පුවරු - පෝරු වේ. ඒ රීතිය අනුව සුවපත් යන්න ''සෝපත්''වේ.

ඩා දිය - දාඩිය, රුහිරු - හුරිරු වේ. එම රීතිය ම මෙහි දු දක්නට ලැබේ.

සුව පත් - සෝ පත්, පෝසත්, පොහොසත් පදයක අසිරිය බලනු මැනවි. පා අත - පාත - පහත වන විදියට ම පෝසත් - පොහෙ-ාසත් වේ.




Piano Lessons

Piano - practical & theory tuition

beginners age 5 & above.
Other grades also may be considered.

Enrol now for 2007
Cheltenham 9583 5586
or 0410012421



GATEWAY LAWYERS

- Advice on Legal Matters
- Business & Commercial
- Conveyancing - Sale or Purchase of Houses, Vacant Land, Units, Flats, Shops, Factories & Farms
- General, Medical or Enduring Powers of Attorney
- Wills & Estate Planning

*Professional, Quality Service Assured*

Senanie Kurukularatne LL.B, Grad Dip.LP
Barrister & Solicitor
Attorney -at- Law - Sri Lanka

Phone : 03 87869682
Fax : 03 87869681
Mobile : 0414 660 513
Email : gateway5@bigpond.net.au
17, Glenview Rise, Berwick, VIC 3806 Austraila